1 වන පිටුවෙන්.....

# මේ ටික අපටත් වෙන්නට තිබුණා ....

## බහරේන් (Bahrain) කැරැල්ල

බහරේන්ද මේ අරාබි බොක්ක හරියේම පිහිටි කුඩා රාජ්‍යයකි. එය සල්මන් බින් හාමඩ් (Salman Bin Hamad) නමැති එමීර් හෙවත් මුස්ලිම් නායකයෙකු විසින් පාලනය කරනු ලබන්නකි. ඔහු සුන්නි මුස්ලිම් වර්ගයට අයත් කෙනෙකි. එරටේ ජනතාවගෙන් 70% ක් ශියා වර්ගයට අයත් මුස්ලිම්වරු වෙති. නමුත් පාලනය සුන්නිවරුන් අතේය. අල්ලපු රටවල් වන සවුදිය, එමිරේට්ස් හා කුවේට් හි ද පාලකයෝ සුන්නිවරු වෙති. මේ අරාබි බොක්කේ (Arabian Gulf) රටවල් සියල්ල අරාබි සහාය මණ්ඩලය (Gulf Coperate Council) යන ආරක්ෂක ගිවිසුමකින් එක්ව පවතී. ඒ අනෙක් ගල්ෆ් රටවල් සේම බහරේනයද ඇමරිකානු ගැති ආණ්ඩුවකි. මෙය ඇමරිකාවේ ආරක්ෂක කටයුතුවලට අත්‍යවශ්‍ය රටක් වන්නේ එම ප්‍රදේශයේ ඇමරිකානු ආරක්ෂක ගුවන් තොටුපළක් ද, නාවික හමුදා වරායක්ද එම රටේ කලක සිට පිහිටුවා ඇති බැවිනි. මුල සඳහන් කළ රටවල කැරලි පැතිර යත්ම බහරේනයේ ද කළබල ආරම්භ විණ. සුන්නි ආගමික වර්ගයා බලය ලත් වරප්‍රසාද ලත් අය වූ අතර, බහුතරයක් වූ ශියා වර්ගයා අනේක තාඩන පීඩන වලට ගොදුරුව සිටිති. මේ කැරලිවල නායකත්වය ගත්තේ ඔවුන් ය.

අගනුවර වන මනාමා (Manama) නගරයේ මුතු වටරවුම (Pearl Rounabout) කේන්ද්‍රස්ථානය කරගෙන පෙබරවාරි 14 වෙනිදා කැරලි ඇරඹිණ. මුල් රවුමේදී කැරලිකරුවන්ට නිර්දය ලෙස වෙඩිතබා පස් දෙනෙක් මරුමුවට පත්වූහ. මෙම කාලය තුළම ඇමරිකන් ආරක්ෂක ලේකම් රොබට් ගේට්ස් ( Robert Gates) එක්සත් අරාබි එමීර් රාජ්‍යය ( UAE - United Arab Emirates) සමග ආයුධ ගණුදෙනුවකට පැමිණෙන මුවාවෙන් බහරේන් වලටද පැමිණ සාකච්ඡා කළ බව වාර්තා විය. ආයුධ ගණුදෙනුව කෙසේ වුවද එහි අරමුණ ඉතා පැහැදිලි ය.

මෙයට පසු එමීර් බින් හමාඩ් කැරලිකරුවන් සමග ප්‍රශ්න සාකච්ඡාකිරීමකට ආරාධනා කළ අතර එය අගනුවරින් පිට ආර්ථික මධ්‍යස්ථානයක් වූ Financial Harbour නමැති ස්ථානයේදී පවත්වන්නට නියම කරගන්නා ලදී. මේ කූට ප්‍රයෝගයට රැවටුණු කැරලි නායකයන් ඇතුලු පිරිසක් පෙබරවාරි 18 වනදා එහි ගියෝය මේ වන විට අර සවුදි සහ එමිරේට්ස් හමුදා රහසේ එහි රැස්ව සිටියහ. ඒ කැරලිකාර සියළු දෙනාම අත්අඩංගුවට ගත් අතර, සමහරු නිර්දය ලෙස වධදී මරාදමන ලදී. සමහරුන් විවිධ චෝදනා මත ජීවිතාන්තය දක්වා සිර දඩුවම් ලැබූහ. මරා දමන ලද අයට කුමක් වූවා දැයි කිසිවෙක් නොදනිති. මේ සවුදි හා එමිරේට්ස් හමුදා මේ ආකාරයේ මාරාන්තික උපක්‍රමවලට පුරුදු පුහුණු කරනු ලැබූ අය බව කියති. මෙසේ මරා දමන ලද සියළු දෙනාම පාහේ අර ශියා වර්ගයට අයත් මුස්ලිම්වරු වූහ. ඇමරිකානු ගැති සවුදිය හා එමිරේට්ස් රටවල් වල ශේක්වරු හා එමීර්වරු හැමදාටම පාලනය ගෙන යන්නේ මෙසේ ය.

මේ ආකාරයට බහරේන් වසන්තය අවසන් වීය. බටහිර මාධ්‍යය මේවා යටපත් කළා විනා කිසිවක් පෙන්වූයේ නැත. ඒ උන්ගේ මාධ්‍ය නිදහසයි. හියුමන් රයිට්ස්කාරයින් එකෙක් මේ ගැන කටක් ඇරියේ නැත. අපි උන්ගෙන් මෙසේ අසමු. “ කෝ බොලව් තොපි නිතර කෑගහන තොපේ මානව හිමිකම් ප්‍රත්පත්ති ? ”

## ලිබියා (Lybya) කැරැල්ල

ලිබියාව ද මෙම ප්‍රදේශයේ ඊජිප්තුව මෙන්ම භූමි ප්‍රමාණයෙන් විශාල රටකි. එසේම ඉරානය, ඉරාකය සේම විශාල ඛනිජ තෙල් ඉන්ධන එහි ඇත. ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් කලක සිට ගිජුලිහිණියන් සේ බැල්ම හෙලාගෙන සිටියේ ලිබියාවේ මෙම තෙල් සම්පත දෙසට ය.

ලිබියාවේ නායක කර්නල් මුහම්මර් ගඩාෆි එම රටේ යුද හමුදාවෙන් මතුවී වසර හතළිහකට පමණ පෙර එය පාලනය කළ රාජකීයයන්ගෙන් බලය අල්වාගත් කෙනෙකි. එයට පෙර අරාබි රජුන්ගේ පාලනය යටතේ පෙලුණු එම ජනතාවට සෙත සැලසෙන කටයුතු රාශියක් ඉටුකළ අයෙකු ලෙස ඔහුට වාර්තාවක් ඇත. එම තෙල් ආකරවලින් ආ ධනය ජනතා සේවාවන්ට ඔහු යෙදීය. අද ද අරාබි ප්‍රදේශයේ නිවාස, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවන් ආදිය ඉහළ මට්ටමකින් ඒ රටේ පවතිනුයේ ගඩාෆිගේ එම කටයුතු නිසාය.

පසුගිය කැරලි සමයේ තුවාලකරුවන් ප්‍රතිකාර සඳහා ගෙනගිය රෝහල්වල ප්‍රවෘත්ති මාධ්‍යයෙන් පෙන්වූ දර්ශන බලාසිටි අයට පැහැදිලිවම පෙනුණේ මේ බටහිර රටවල වගේම



ලිබියානු නායක මුහම්මර් ගඩාෆි
Libyan leader MuammarGaddafi

වෛද්‍ය උපකරණ හා රෝහල් පහසුකම් ඒ රටේ තිබෙන බවය.

එක් ආකාරයක විප්ලවකාරයෙකු වූ ගඩාෆි ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් සමග දිගු කලක් ගැටුණේය. එමිරේට්ස් වල රාජකීයයන් ඔහු තුට්ටුවකටවත් ගණන් ගත්තේ නැත. මේ නිසාම එම රටවල ගඩාෆි කෙරෙහි තද වෛරයක් කාලයක් තිස්සේ පවතී. එහෙත් අප්‍රිකා මහා ද්වීපයේ ගඩාෆි ප්‍රබල මිනිසෙකු වීය.

වසර හතළිහක් දිගටම පාලනයේ සිටි ඔහු පසු කලෙක සිට පිරිහෙන්නට පටන්ගත්තේය. බටහිර මාධ්‍යය කවදත් කළ ආකාරයට ගඩාෆි පිස්සෙක්, ඔල්මාදකාරයෙක් හැටියට පිළිබිඹු කළාය. අරාබි වසන්ත කැරලිකරුවෝ ජනවාරි පෙබරවාරි සමයේ ලිබියාවේ ද කැරලි ඇරඹූහ. නමුත් ගඩාෆිට ජනතාව අතර ද බලය තිබුණු බැවින් අනෙක් තැන්වල මෙන් කැරලිකරුවන්ට බලය ගැනීම පහසු වූයේ නැත.

ලිබියාවේ නැගෙණහිර ප්‍රදේශයක් වූ බෙන්ගාසි හි බලය මාස කීපයකට පෙර කැරලිකරුවෝ ලබාගත්හ. එය කේන්ද්‍රකරගෙන යටින් පැවති ඇමරිකන් හා බ්‍රිතාන්‍ය යටිකූට්ටු වැඩවල උදව්වෙන් ජාතික අන්තර් මණ්ඩලයක් National Transition Council ඔව්හු පත්කර ගත්හ. මේ තාවකාලික ආණ්ඩුව පිහිටුවා ගත්තේ මේ බටහිර රටවලට පිටුවහල්ව පැන අවුත් සිටින අපේ ඩයස්පෝරාව වැනි අයයි. කැරලිකාරයින් සහ හමුදා ගැටුම් වලදී වෙඩිතැබීම් ආදියෙන් ඔවුන් මර්දනය කරන ලදී. බටහිර මාධ්‍ය මේවාට ප්‍රචාරය දෙමින් සිටියහ. ඇමරිකාව එම සිදුවීම් ගඩාෆි පළවාහැරීමට අවස්ථාවක් කරගත්හ. ඒ තුළින් ඇමරිකාවට, බ්‍රිතාන්‍යයට හා ප්‍රංශයට දැනට ගරාවැටෙමින් තිබෙන ඔවුන්ගේ ආර්ථිකයන්ට මුක්කුවක් ගසාගැන්මට මගක් පාදාගත හැකි බව පෙනිණ.

ගඩාෆි කළ මර්දනය සමග මාධ්‍යය තමනට දුන් දිරිගැන්මද නිසා කැරලිකරුවෝ සටන් උග්‍ර කළහ. ගැටුම් වලින් සිදුවන මරණ වැඩිවත්ම ගඩාෆිව මර්දනය කළ යුතුය යන අදහස උඩ යෝජනා එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට ඉදිරිපත් කෙරිණ. බටහිර බැංකුවල ලිබියාවේ සහ ගඩාෆිගේ විශාල ධනස්කන්ධය තහනම් කිරීම ආදී තහනම් ගෙන ආවද ගඩාෆි ඒවා තුට්ටුවකටවත් ගණන් ගත්තේ නැත. මේ වනවිට ගඩාෆිගේ ක්‍රියා රුසියාව, චීනය ආදී රටවල ද නොරිස්සුමට පත්ව තිබිණ.

ගඩාෆිගේ ක්‍රියා මර්දනය කරලීමේ යෝජනාවක් ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවලින් ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කෙරිණ. අරාබි රටවල් ද මෙය අනුමත කළෝය. මෙය සාකච්ඡා මගින් විසඳා ගත යුතු යයි රුසියාව යෝජනා කළ ද එය පිළිගැනුණේ නැත. අරාබි ඡන්ද සමග ද, රුසියාව හා චීනය ඡන්දය දීමෙන් වැලකුන බැවින්ද අමෙරිකානු යෝජනාව සම්මත විය. ඒ සමගම මේ සඳහා යම් සීමාවන් ඇතුළත **NATO** නේටෝ සංවිධානය උපයෝගී කරගැන්මට ද ආරක්ෂක මණ්ඩල අනුමැතිය ඇමරිකාව ලබාගත්තේය. නේටෝ යනු ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල යුද සංවිධානයයි.

එයින් පසු පසු ගිය මාස දෙක ඇතුළත නේටෝව යුද්ධයට සම්බන්ධ වූ ආකාරයද, දුර සීමාවන් උල්ලංඝනය කරමින් එය හැසිරුණ ආකාරයද පැහැදිලිව පෙනෙන්ට තිබුණි. එක්සත් එමිරේට් සහ සවුදි අරාබියෙන් කැරලි කරුවන්ට ආයුධ හොර රහසේම ලැබිණ. ට්‍රිපොලිය ඇල්ලීම සඳහා නේටෝ ගුවනින් වෙඩිතැබීම් ආදිය නිර්දය ලෙස යෙදුවේ එක්සත් ජාතීන්ගේ මණ්ඩලය පැනවූ සීමාවන් ද නිර්දය ලෙස උල්ලංඝණය කරමිනි.

බටහිර මාධ්‍යය දිගටම පෙන්වූයේ පොලු සහ කොඩි පමණක් අතේ ඇති කැරලිකරුවන් සටන්කරන බවකි. නමුත් නේටෝ හමුදාවක් වත් නොපෙන්වූහ. ඇත්තටම එහිදී සිදුවූයේ නේටෝ හමුදා හොර රහසේ කළ ප්‍රහාර සටන් වලින් ට්‍රිපොලිය වැටීමය.

ට්‍රිපොලිය වැටෙන්නටත් පළමු ලිබියාවේ තෙල් ආකරයන්හි දඩයම බෙදාගැන්ම ගිය සති කීපය තුළ ඇරඹිණ. දඩයම කරගත් මස්වැද්දා (ඇමරිකාව) ලොකු කුට්ටිය ගෙන ඇත. සහාය වූ බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ (දඩ බල්ලන්) දැන් කටු කන්නාක් මෙන් සිය කොටස් සඳහා පොරකති. දැන් උන්ට ලිබියාවේ ජනතාවට හෝ කැරලිකරුවන්ට හෝ කුමක් වුවද කම් නැත. අරාබි වසන්තයේද අවසානය මෙය වනු ඇත.

ට්‍රිපොලිය වැටෙනවාත් සමගම ලොව බටහිර රටවල ගරාවැටෙමින් තිබුණු ආර්ථික දර්ශකයන් මට්ටම් වලින් ඉහළ යන බවක් පෙනිණ. සිය ආර්ථිකයන්ට මුක්කු ගසාගැනීම සාර්ථක වී ඇත.

එහෙත් ලිබියාවද ඇෆසනිස්ථාන්, ඉරාකය ආදී රටවල් වැටී ඇති අරාජික තත්වයටම වැටෙනු ඇතැයි විමර්ශකයන්ගේ අදහසයි. මේ සියළු සිදුවීම් තුළ ඇමරිකාවත් බ්‍රිතාන්‍යයත් ප්‍රංශයත් ඇතුළු බටහිර කූට යුදකාමීන්ගේ කැත හස්තය පෙනෙන්ට ඇත. මේවා ගැන සුපරීක්ෂාකාරීව සිතා බැලිය යුතු අතර ඉදිරියේදී ඒවා සාකච්ඡාකිරීමට අදහස් කරමු.

**බටහිර මාධ්‍යය දිගටම පෙන්වූයේ පොලු සහ කොඩි පමණක් අතේ ඇති කැරලිකරුවන් සටන්කරන බවකි. නමුත් ඇත්තටම එහිදී සිදුවූයේ නේටෝ හමුදා හොර රහසේ කළ ප්‍රහාර සටන් වලින් ට්‍රිපොලිය වැටීමය.**



The heavy damage caused by Nato's recent bombing in Libya
නැටෝ හමුදා ළඟදි කළ බෝම්බ ප්‍රහාරයෙන් ලිබියාවට සිදුව ඇති හානිය

# මෙය සිරිලකටත් වෙන්නට තිබුණා!

ලෝකයේ අද දවසේ යම් යම් සිද්ධීන් සිදුවන ආකාරයත් සිදුවන ඉක්මනත් දකින විට හෙට දවස ගැන හරියටම කිව නොහැකි බව හැඟේ. එහෙත් අතීතය දිහා බලා මෙය එදා තව ඩිංගෙන් වෙන්නට තිබුණා නොවේදයි සාධාරණ විශ්වාසයකින් යුතුව සිතිය හැකිය. එසේ නොවන්නට ද විය හැකි නමුත් බොහෝ විට අපට දැන් සිතෙන්නේ යමක් විය හැකිව තිබුණු බවයි. මේ සිතුවිල්ල මගේ සිතට ආවේ අප අත්දුටු හා තවමත් අත්දකින දේවල් දැන් වර්තමානයේ ලොව පුරා බොහෝ රටවල නිතර සිදුවන නිසා ය.

**BBC, Fox News, Sky , Al Jazeera, CNN** ආදී පුවත් බෙදාහරින සුප්‍රකට ආයතන සියල්ල එකිනෙකා හා තරඟ වැදී සිටිති. හොඳම පුවත් සොයා අනෙකාට කලින් විසුරුවා හැරීමට ඔවුන් දරණ ප්‍රයත්නය අපට පෙනේ. හොඳම පුවත් යනු මිනිසුන්ගේ දැඩි අවධානය යොමු වන පුවත් ය. නොවැදගත් දෙයක් වුව ද විවිධ රූපරාමු යොදා විවිධ කටහඬවල් යොදා වැදගත් දෙයකට හරවන හැටි ඔව්හු දනිති. ඉහතකී මාධ්‍ය හා පුවත් මවන ආයතන ක්‍රියාකරන්නේ බටහිර ධනවත් රටවල් වල ඕනෑ එපාකම් අනුව ය.

මේ මෑත දිනවල ඉහතකී මාධ්‍ය ආයතන සියල්ල එළවන්නේ ඊජිප්තුවේ, සිරියාවේ සහ ලිබියාවේ සිදුවන දේ පසුපස ය. ඒ මගින් බටහිර රටවල රජය යන්හි සහ ජනතාවගේ අවධානය එම අරාබි රටවල පවතින ජනතා උද්ඝෝෂණ වෙත යොමු කරවීමටයි. මෙසේ මේ මාධ්‍ය උළුප්පා පෙන්වන කරුණු සිතට ගන්නා බොහෝ දෙනා තුළ ඒ රටවල නායකයන් කෙරෙහි අප්‍රසාදයක් හටගනී.

ප්‍රවෘත්ති දකින විට අපට සිතෙන්නේ ඒ රාජ්‍යයන් පෙරලා දමන්නට වැඩියම ඕනෑකම ඇත්තේ මේ බටහිරින් ගිහින් ඉන්නා මාධ්‍ය කාරයින්ට බවයි. ලොව වටා විකාශනය වූ ප්‍රවෘත්ති වල වැඩිපුරම පෙන්වූයේ කැරලිකාර යින් නගන උද්ඝෝෂණ සහ ඔවුන් දැන් ඒ ඒ රජයයන් පෙරලන්නට ශක්තිමත්ව සිටින බවයි.

“හෙට වන විට මුබාරක් වැටෙන්න පුළුවන්. ලබන සතිය වන විට ගඩාෆි වැටෙන්න පුළුවන්. කැරලිකරුවන් නව රජයක් පිහිටුවන්නට සූදානම්. වහාම බලයෙන් ඉවත් වන්නට ගඩාෆිට නේටෝ අවවාද කරනවා.”

ශ්‍රීලංකාවේ යුද්ධය නිමා නොවී මේ වනතුරුත් පැවතුනා නම් නම් බ්‍රිතාන්‍යය ද, ඇමරිකාව ද, නෝර්වේ ද එකතු වී තම රටවල සිටිනා ඊළම්වාදී දෙමළ අයට සම්පූර්ණ සහයෝගය දෙමින් ලංකාවේ කොටින්ට ඊළම් රාජ්‍යයක් පිහිටුවන්නට නිසැක වශයෙන්ම උදව් කරනවා ඇතියි සිතිය හැකිය. **BBC, Fox News, Sky , AlJazeera, CNN** ආදී සියළු ආයතන අද ලිබියාවේ කැරලිකාරයින් ගැන ප්‍රශංසා කරන්නාක් මෙන්, ම්ලේච්ඡ ත්‍රස්තවාදී කොටි ශ්‍රීලංකා රජය පෙරලූ සටන්කාමී තරුණයින් පිරිසක් වශයෙන් ලොවට හඳුන්වා දෙනවා ඇත. ශ්‍රීලංකා ජනාධිපති, අගමැති, ආරක්ෂක ලේකම් සහ ලංකා ත්‍රිවිධ හමුදාව යුද අපරාධකාරයින් ලෙස හංවඩු ගසා ජාත්‍යන්තර උසාවියට ගෙන යන්නට කටයුතු කරනවා ඇත. චැනල් **4** ආදී නාලිකා පැයෙන් පැයට පුවත් කියවමින්, කොටි ඊළම් කොඩිය වනන පින්තූර පෙන්වමින් ලංකාවේ අළුත් ඊළම් රජය ගැන වර්ණනා කරනවා ඇත. “මෙන්න ශ්‍රීලංකාවේ රාජපක්ෂ රජය බිඳ වැටුණා.... මෙන්න කොටි නායක මිස්ට ප්‍රභාකරන් ඊළම් රජයක් පිහිටවන්නට බලාපොරොත්තු වෙනවා..... මෙන්න ප්‍රසිඩන්ට් ඔබාමා ඔහුගේ සුභපැතුම් අළුත් ඊළම් රජයට පිරිනමනවා.....” ආදී වශයෙනි. එය අසා ලොව වටා සිටින කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාව සතුටින් උද්දාමව බඩ පිඹුම් ගසනවා ඇත.

ලෝකයේ ප්‍රබල තත්වයක සිටි ඊජිප්තුව ලිබියාව ආදී රටවලට පතිතවුණු මේ ව්‍යසනය දකින විට එම අවාසනාවට ඉතා සමීපව සිටි නමුත් එවැන්නකට ගොදුරු නොවී ඉන් බේරෙන්නට ශ්‍රීලංකාවට හැකිවීම ගැන අද අපට සතුටු විය හැකි ය. කෙසේ හෝ අවශ්‍ය මොහොතේ නැණ නුවනින් යුතුව ශ්‍රීලංකා රජය කටයුතු කිරීමත්, අප සන්නද්ධ සේනාංකයන්හි ධෛර්‍යය හා අතිශය කැපවීමත් නිසා අප රටටද, ජනතාවටද යහපතක් ම වූ බව අප සිත්හි තබාගත යුතු ය.

♦ වෙනුර